# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2011 අංක 39 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 ඔක්තෝබර් මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 ඔක්තෝබර් මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2011 අංක 39 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 ඔක්තෝබර් මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 33/2009.

### (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 39 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. කාර්මික ආරවුල් පනතේ (131 වන අධිකාරය වූ) 43 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 131 වන අධිකාරයේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (5) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඝඝ) ඡේදය යටතේ වූ වරදක් හැර, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය." ;

(2) එම උපවගන්තියේ (1අ) වන වගන්තියෙහි "රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට", යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (i) වන ඡේදයේ "එක් එක් දිනය සඳහා රුපියල් පනහක දඩය බැගින්" යන වචන වෙනුවට "එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩය බැගින් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

2—PL 006196—3,230 (2011/08)

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ "එක් එක් දිනය සඳහා රුපියල් පනහක දඩය බැගින්" යන වචන වෙනුවට "එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩය බැගින් " යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.